ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ: ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය: 2015 දෙසැම්බර් මස 08 වැනි දින

## 2015 සැප්තැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

සංචාරක ඉපැයීම්හි හිතකර වර්ධනයත්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි මධ්‍යස්ථ වර්ධනයත් හේතුවෙන් 2015 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සාමාන්‍ය මට්ටමක පැවතුණි. සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ හිඟය පහළ ගිය ද, 2015 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලය තුළ සමුච්චිත පදනම මත වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 6,145 ක් දක්වා වර්ධනය විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යනු ඇතැයි වන අපේක්ෂාව හමුවේ, නැගී එන ආර්ථිකයන් තුළ දක්නට ලැබුණු ප්‍රවණතාවට සමගාමීව මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් මධ්‍යස්ථ විය. ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් මෑතක දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් සමඟ විදේශීය අංශය ඉදිරි මාස කිහිපය තුළ දී ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

### අපනයන ක්‍රියාකාරිත්වය

2015 මාර්තු මාසයේ සිට අඛණ්ඩව හත්වන මාසයටත් අඩු වීමක් වාර්තා කරමින් 2015 සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 850 ක් දක්වා සියයට 5.9 කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන්ම රබර් නිෂ්පාදිත, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ කාර්මික නිෂ්පාදිත අපනයනයන්හි අඩු ක්‍රියාකාරිත්වය හේතුවෙන් කාර්මික නිෂ්පාදන

සියයට 4.7 කින් අඩු වීම අපනයනවල සමස්ත අඩු වීමට සියයට 60 කින් පමණ දායක විය. කෙසේ වුවද, මුළු අපනයනවලින් සියයට 48 ක් පමණ වූ රෙදිපිළි හා ඇඟලුම් අපනයන, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, හොංකොං සහ එක්සත් එමීර් රාජ්‍යය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වෙත කරන ලද ඇඟලුම් අපනයනවල සැලකිය යුතු ඉහළ යෑමක් පිළිබිඹු කරමින් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.8 කින් වර්ධනය විය. මේ අතර, 2015 සැප්තැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 11.3 කින් අඩු වූ අතර පෙර මාස කිහිපය තුළ දී මෙන්ම මෙම මාසයේ දී ද තේ සහ මුහුදු ආහාර අපනයන සැලකිය යුතු ලෙස අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රුසියාව සහ මැදපෙරදිග රටවල් වෙතින් වූ ඉල්ලුම අඩු වීම මගින් තේ අපනයන දැඩි බලපෑමකට ලක් විය. ඒ අනුව, තේ අපනයන පරිමාව මෙන්ම අපනයන මිල ගණන්වල අඩු වීම පිළිබිඹු කරමින්, 2015 සැප්තැම්බර් මාසයේ දී තේ අපනයන ආදායම 2014 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 20.4 කින් අඩු විය. තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 2014 සැප්තැම්බර් මාසයේ පැවැති කිලෝග්‍රෑමයට එ.ජ.ඩොලර් 5.01 ට සාපේක්ෂව මෙම වසරේ අදාළ කාල සීමාව තුළ දී කිලෝග්‍රෑමයට එ.ජ.ඩොලර් 4.32 ක් දක්වා අඩු විය. ශ්‍රී ලංකාවෙන් මුහුදු ආහාර ආනයනය කිරීම සඳහා යුරෝපා සංගමය වෙතින් පනවා ඇති තහනම හේතුවෙන් මුහුදු ආහාර අපනයනය ද 2015 සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් අඩු විය. ඒ අනුව, 2015 සැප්තැම්බර් මාසයේ දී යුරෝපා වෙළෙඳපොළ වෙත කළ මුහුදු ආහාර අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 82.4 කින් අඩු විය. කෙසේ වුවද, වසරේ පෙර මාසවල දක්නට ලැබුණු යහපත් ක්‍රියාකාරීත්වය තවදුරටත් පවත්වා ගනිමින් මෙම මාසයේ දී කුළුබඩු අපනයන ආදායම සියයට 34.9 කින් වර්ධනය වූ අතර ගම්මිරිස් සහ කරාබු නැටි අපනයන මේ සඳහා මූලික විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, වසරේ පළමු මාස නවය තුළ දී අපනයන ආදායම කෘෂිකාර්මික හා කාර්මික අපනයනවල පහළ යෑම් පිළිබිඹු කරමින් සියයට 3.7 කින් අඩු විය. 2015 වසරේ පළමු මාස නවය තුළ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළවල් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය, ඉතාලිය සහ චීනය පැවති අතර, මෙම රටවල් වෙත කළ අපනයන මුළු අපනයනයෙන් සියයට 54 ක් පමණ විය.

සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2014 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2015 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| 1. කාර්මික අපනයන | **667.5** | **636.4** | **(4.7)** | **6,159.0** | **6,082.5** | **(1.2)** |
| සත්ව ආහාර | 4.0 | 7.1 | 76.0 | 50.8 | 58.2 | 14.5 |
| රෙදිපිළි හා ඇඟලුම් | 403.8 | 411.2 | 1.8 | 3,659.7 | 3,629.9 | (0.8) |
| රබර් නිෂ්පාදිත | 70.5 | 58.6 | (16.9) | 669.5 | 583.5 | (12.9) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 32.5 | 24.6 | (24.4) | 301.4 | 243.4 | (19.2) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 29.3 | 23.5 | (19.6) | 253.8 | 220.8 | (13.0) |
| රසායනික නිෂ්පාදිත | 11.7 | 12.2 | 4.2 | 101.4 | 95.8 | (5.4) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 10.9 | 5.2 | (52.3) | 43.2 | 37.8 | (12.6) |
| වෙනත් | 104.7 | 94.0 | (10.3) | 1,079.1 | 1,213.1 | 12.4 |
| 2. කෘෂිකාර්මික අපනයන | **231.9** | **205.6** | **(11.3)** | **2,080.3** | **1,873.5** | **(9.9)** |
| තේ | 133.6 | 106.3 | (20.4) | 1,216.7 | 1,007.5 | (17.2) |
| පොල් | 33.4 | 34.6 | 3.5 | 267.3 | 272.6 | 2.0 |
| කුළුබඩු | 27.4 | 37.0 | 34.9 | 188.5 | 286.3 | 51.9 |
| සුළු කෘෂිකාර්මික බෝග | 10.6 | 11.4 | 7.8 | 114.6 | 118.1 | 3.0 |
| මුහුදු ආහාර | 17.7 | 10.0 | (43.4) | 194.1 | 122.5 | (36.9) |
| වෙනත් | 9.1 | 6.3 | (31.2) | 99.1 | 66.5 | (32.9) |
| 3. ඛනිජ වර්ග සහ වෙනත් | **3.5** | **7.6** | **119.0** | **62.6** | **40.2** | **(35.9)** |
| මුළු අපනයන | **902.8** | **849.6** | **(5.9)** | **8,302.0** | **7,996.1** | **(3.7)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

## ආනයන ක්‍රියාකාරිත්වය

2015 සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,583 ක් දක්වා සියයට 5.1 කින් අඩු විය. ආයෝජන භාණ්ඩ ආනයනය අඩු වීම මෙම අඩු වීම කෙරෙහි වැඩි වශයෙන් ම දායක වූ අතර අනතුරුව අන්තර් භාණ්ඩ ආනයන මේ සඳහා දායක විය. ආයෝජන භාණ්ඩ ආනයනවල වාර්තා වූ අඩු වීම සඳහා ප්‍රවාහන උපකරණ ආනයනය අඩු වීම ප්‍රධාන වශයෙන් දායක විය. ත්‍රිරෝද රථ, වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා කැබ් රථ සහ කෘෂිකාර්මික ට්‍රැක්ටර් වැනි වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ආනයනය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වුවද, ප්‍රධාන වශයෙන් කැනීම් කටයුතු සිදු කරන යාත්‍රාවක් ආනයනය කිරීම හේතුවෙන් 2014 සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම ඉහළ යෑම 2015 සැප්තැම්බර් මාසයේ දී ප්‍රවාහන උපකරණ සඳහා වූ ආනයන වියදම සියයට 47.9 කින් විශාල ලෙස පහත වැටීම සඳහා හේතු විය. අන්තර් භාණ්ඩ ආනයන වියදමෙහි සිදු වූ සියයට 4.8 ක අඩු වීම සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ ඉන්ධන මිල ගණන් අඩු වීමට සමගාමීව ඉන්ධන ආනයන වියදම නොකඩවා අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 100.08 ක් වූ බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2015 සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර්

48.65 ක් දක්වා අඩු විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග, දියමන්ති සහ අගනා ගල් වර්ග හා ලෝහ සහ මූල ලෝහ ආනයන වියදම් ද මෙම මාසය තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවද, අන්තර්භාණ්ඩ යටතේ වර්ගීකරණය කෙරෙන තිරිඟු හා ඉරිඟු, පොහොර හා ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම 2015 සැප්තැම්බර් මාසයේ දී සැලකිය යුතු ලෙස වැඩි විය. 2014 මැයි මාසයේ සිට පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව ඉහළ ගිය පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2015 සැප්තැම්බර් මාසයේ දී ද සියයට 7.4 කින් වැඩි වූ අතර වාහන ආනයන වැඩි වීම මේ සඳහා හේතු විය. මෝටර් කාර් රථ සහ විදුලි බලයෙන් ධාවනය වන වාහන ආනයන ඉහළ යෑම මගින් පෞද්ගලික මෝටර් රථ සඳහා වූ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 30.2 කින් වැඩි විය. තවද ඇඟලුම් හා උපාංග, විදුලි සංදේශ උපකරණ සහ මුහුදු ආහාර ආනයන වියදමෙහි වැඩි වීම ද පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි වැඩි වීම සඳහා විශාල වශයෙන් දායක විය.


සමුච්චිත වශයෙන් සැලකූවිට 2015 වසරේ පළමු මාස නවය තුළ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 14,141 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් අඩු වූ අතර අන්තර් භාණ්ඩ සඳහා වූ ආනයන වියදමෙහි සිදු වූ සියයට 16.1 ක පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2015 වසරේ පළමු මාස නවය තුළ දී, ඉන්දියාව, චීනය, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර එය මුළු ආනයනයන්ගෙන් සියයට 60 ක් පමණ විය.


සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2014 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2015 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **365.5** | **392.4** | **7.4** | **2,653.8** | **3,534.8** | **33.2** |
| ආහාර හා පාන වර්ග | 151.7 | 115.4 | (23.9) | 1,147.3 | 1,239.8 | 8.1 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 47.3 | 4.5 | (90.5) | 134.1 | 143.3 | 6.8 |
| කිරි නිෂ්පාදිත | 26.7 | 19.0 | (28.9) | 264.4 | 188.6 | (28.7) |
| මුහුදු ආහාර | 12.9 | 24.6 | 90.8 | 102.7 | 153.7 | 49.7 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 64.7 | 67.3 | 4.0 | 646.1 | 754.2 | 16.7 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 213.8 | 276.9 | 29.5 | 1,506.5 | 2,294.9 | 52.3 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 32.1 | 37.3 | 16.1 | 280.3 | 342.0 | 22.0 |
| රථවාහන | 97.0 | 126.2 | 30.2 | 573.4 | 1,030.9 | 79.8 |
| අනෙකුත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 84.7 | 113.4 | 33.9 | 652.9 | 922.0 | 41.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **870.7** | **829.0** | **(4.8)** | **8,609.7** | **7,226.2** | **(16.1)** |
| ඉන්ධන | 295.3 | 226.4 | (23.4) | 3,743.8 | 2,015.6 | (46.2) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 199.1 | 168.2 | (15.5) | 1,668.8 | 1,715.6 | 2.8 |
| රසායනික නිෂ්පාදිත | 68.3 | 67.5 | (1.2) | 580.8 | 653.2 | 12.5 |
| තිරිඟු හා ඉරිඟු | 38.9 | 74.2 | 90.5 | 307.0 | 288.3 | (6.1) |
| මූල ලෝහ | 39.8 | 25.0 | (37.4) | 356.0 | 350.8 | (1.5) |
| පොහොර | 7.7 | 38.8 | 407.0 | 170.8 | 200.8 | 17.5 |
| ඛනිජ නිෂ්පාදිත | 15.7 | 41.6 | 165.1 | 168.1 | 178.1 | 5.9 |
| සකස් නොකළ දුම්කොළ | 5.8 | 6.2 | 7.2 | 50.5 | 66.8 | 32.3 |
| වෙනත් | 200.1 | 181.2 | (9.4) | 1,563.8 | 1,757.0 | 12.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **428.8** | **359.6** | **(16.1)** | **2,947.8** | **3,367.0** | **14.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 177.2 | 166.8 | (5.9) | 1,546.3 | 1,649.7 | 6.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 111.3 | 119.5 | 7.3 | 948.5 | 964.6 | 1.7 |
| ප්‍රවාහන උපකරණ | 140.1 | 73.0 | (47.9) | 450.7 | 749.4 | 66.2 |
| වෙනත් | 0.2 | 0.3 | 108.1 | 2.3 | 3.4 | 45.9 |
| **4. වර්ග නොකළ ආනයන** | **2.4** | **1.8** | **(28.1)** | **11.0** | **13.3** | **20.5** |
| **මුළු ආනයන** | **1,667.5** | **1,582.7** | **(5.1)** | **14,222.3** | **14,141.3** | **(0.6)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




**වෙළඳ ශේෂය**

2014 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 765 ක් වූ වෙළඳ ගිණුමේ හිඟය 2015 සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 733 ක් දක්වා සියයට 4.1 කින් අඩු විය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකූ විට 2015 වසරේ පළමු මාස නවය තුළ දී වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 6,145 ක් දක්වා සියයට 3.8 කින් වර්ධනය විය.

**සංචාරක ඉපැයීම්**

සංචාරක පැමිණීම් අඛණ්ඩව වර්ධනය වෙමින් 2015 ඔක්තෝබර් මාසය තුළ දී මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 132,280 ක් දක්වා පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 8.8 ක වර්ධනයක් ලෙස වාර්තා විය. වසරේ පළමු මාස දහය තුළ දී මුළු සංචාරක පැමිණීම් සංඛ්‍යාව 1,448,119 ක් වූ අතර, එය 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී සියයට 17.9 ක වර්ධනයකි. මෙම කාලපරිච්ඡේදය තුළ දී චීන සංචාරක පැමිණීම් පසුගිය වසරට සාපේක්ෂව ඉහළම වර්ධනය වන සියයට 70.4 ක් වාර්තා කළ අතර සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන රටවල් දහය අතර ඉන්දියාව සහ චීනය තවදුරටත් ප්‍රධානත්වය ගැනීමට සමත් විය.

2015 ඔක්තෝබර් මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 210.6 ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 8.8 ක වර්ධනයකි[1]. 2015 වසරේ පළමු මාස දහය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වූ එ.ජ.ඩොලර් මිලියන 1,956.1 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 2,305.3 ක් දක්වා සියයට 17.9 කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

---

1 සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2015 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2015 සැප්තැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීම මන්දගාමී වූ අතර, එමගින් ලද විදේශ විනිමය ප්‍රමාණය 2014 සැප්තැම්බර් මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 575.0 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 584.2 දක්වා සියයට 1.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. සමුච්චිත පදනම මත 2015 සැප්තැම්බර් මාසය දක්වා කාල සීමාව තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී සියයට 1.8 ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ.ඩොලර් මිලියන 5,182.2 ක් විය.

**මූල්‍ය ලැබීම්**

2015 වසරේ පළමු මාස දහය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශිකයින් විසින් සිදු කළ ආයෝජන 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 109 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,043 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2015 ඔක්තෝබර් මස අග වන විට කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ.ඩොලර් මිලියන 5.4 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය ද්විතීයික වෙළඳපොළෙහි වූ එ.ජ.ඩොලර් මිලියන 27.2 ක ශුද්ධ විදේශ ආයෝජන ගෙවීම්වලින් සහ 2015 සැප්තැම්බර් මාසය අග වන විට ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 32.6 ක ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. ඇමරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ දමනු ඇතැයි යන අපේක්ෂාව හමුවේ ආයෝජන කළඹ සංතුලනය කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය මාස කිහිපය පුරාවට විදේශීය ආයෝජන මන්දගාමීව පැවතුණි. රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය ද පහළ අගයක පැවති අතර, එය වසරේ පළමු කාර්තු තුන තුළ දී 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 611.5 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 180.9 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2015 වසරේ පළමු කාර්තු තුන තුළ දී සමස්ත ගෙවුම් තුලනය පසුගිය වසරේ අදාළ කාලසීමාව තුළ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,996 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 2,316 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2015 සැප්තැම්බර් මාසය අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.8 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ආනයනික මාස 5.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 8.4 ක් විය. මේ

අතර, 2015 සැප්තැම්බර් මස 04 වන දින මහ බැංකුව විසින් විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හැරීම සඳහා ගත් තීරණය හේතුවෙන් රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 5.9 කින් අවප්‍රමාණය වූ අතර, වසර ආරම්භයේ සිට දෙසැම්බර් මස 08 වැනි දින දක්වා රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 8.5 කින් අවප්‍රමාණය විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව රුපියල, යූරෝවලට එරෙහිව සියයට 2.5 කින්, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 3.5 කින් සහ කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 6.7 කින් අධිප්‍රමාණය වූ අතර, ජපන් යෙන්වලට එරෙහිව සියයට 5.6 කින්, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 5.4 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 3.6 කින් අවප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3. විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් (අ)**

| කාණ්ඩය | 2014 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2015 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-සැප් (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-සැප් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 902.8 | 849.6 | -5.9 | 8,302.0 | 7,996.1 | -3.7 |
| ආනයන | 1,667.5 | 1,582.7 | -5.1 | 14,222.3 | 14,141.3 | -0.6 |
| වෙළඳ ශේෂය | -764.6 | -733.1 | -4.1 | -5,920.3 | -6,145.2 | 3.8 |
| සංචාරක ඉපැයීම් | 168.0(b) | 228.2 | 35.9 | 1,762.5 | 2,094.7 | 18.8 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 575.0 | 584.2 | 1.6 | 5,089.7 | 5,182.2 | 1.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -9.5 | 1.3 | -114.0 | 47.2 | 9.2 | -80.6 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 133.1 | 169.7 | 27.4 | 4,430.9 | 2,599.1 | -41.3 |
| එයින්: | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 63.6 | 88.3 | 39.0 | 1,610.4 | 1,091.7 | -32.2 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500.0 | 650.0 | -56.7 |
| දිගුකාලීන ණය | 68.7 | 81.4 | 18.4 | 1,252.7 | 833.0 | -33.5 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.